# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2023

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙ හි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරුවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවා කොන්දේසි* :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට ද 'ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්' තනතුරට තෝරාගනු ලබන අපේක්ෂකයෙකු යටත් වන්නේ ය.

2.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව වන 12.18 වගන්තිය ප්‍රකාර ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා/හෝ ඉදිරියේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

03. *වැටුප* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ වැටුප් පරිමාණය SL 1-2016 (මාසික) රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක් වේ. (මෙම තනතුරට හිමි ආරම්භක වැටුප SL 1 - 2016 වැටුප් පරිමාණයේ 12 වන පියවර වේ. ඒ අනුව ආරම්භක වැටුප රු. 62,595 කි.) පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම්* :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,

සහ

(ආ) 2023.09.22 දිනට වයස අවු. 30ට නොඅඩු සහ අවු. 45ට නොවැඩි වීම,

සහ

(ඇ) අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම හෝ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I වන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ එම තනතුරක ස්ථිර කර තිබීම,

හෝ

(ඈ) අවුරුදු 07කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටින නීතිඥවරයෙකු වීම.

*සටහන* :-

i. යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතිඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්වයෙන් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවය කරන ලද කාල පරිච්ඡේදයක් ක්‍රියාකාරී ව වෘත්තියෙ හි යෙදී සිටි කාල පරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ.

ii. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

iii. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 13.5 අනුව ''**සතුටුදායක සේවා කාලය**'' යනු උපලේඛනගත රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු/ඇය විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාලසීමාවක් වන්නේ ය.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඊ) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*සැ. යු.*- සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2023 සැප්තැම්බර් මස 22 වැනි දින** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. මූලික සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව තනතුර සඳහා සුදුස්සෙකු තෝරාගනු ලැබේ.

07. තනතුර සඳහා බඳවා ගනු ලැබුයේ ඉහත 05(ඇ) යටතේ වූ සුදුසුකම් සපුරන ලද නිලධරයෙකු නම්, මෙම තනතුරට පත්වීමේ දින සිට වසර එකක වැඩ බැලීමේ සේවා කාලයකට යටත් වන්නේය. තනතුර සඳහා බඳවාගනු ලැබුයේ ඉහත (05) (ඈ) යටතේ වූ සුදුසුකම් මත නම්, එසේ තනතුරට පත් වූ නිලධරයකු පත්වීමේ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

08. තමා වෙත පිරිනමන ලද තනතුරෙ හි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත් කරන ලද තනතුරෙ හි රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවකුගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

09. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදු කළ බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු. 500 කි. මෙම මුදල ''අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්'' නමින් මහජන බැංකුව, වෙල්ල විදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039 ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. මුදල් ගෙවීම සඳහා අදළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, **2023.10.20 දින** හෝ ඊට පෙර ලැබෙන පිණිස 'ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12, යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

11.(අ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චය-කාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥ-වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඇ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිඳු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

12. මෙහි ඉහත 01 සිට 11 දක්වා ඡේද/වගන්තීන්වල විධිවිධාන සලසා නොමැති කරුණක් වෙතොත් ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත් ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරනු ඇත.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

09-415